# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
**CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சு
**MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING**

CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY


| මගේ අංකය. எனது இல. My No. | 1/9/3/i (b) | ඔබේ අංකය. உமது இல. Your No. | | දිනය. திகதி Date | 27.01.2023 |
|---|---|---|---|---|---|

අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු

**ශ්‍රී ලංකාව තුල හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා සම්මත ලංසු ලේඛන භාවිතා කිරීමේ අවශ්‍යතාවය අවධාරනය කිරීම**

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රධාන නියාමන ආයතනය ලෙස පිහිටුවන ලද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව ශ්‍රී ලංකාව තුල සිදුකරන ඕනෑම හඳුනාගත් ඉදිකිරීම් වැඩක්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 30 සහ 38 වගන්ති යටතේ නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයන්හි සඳහන් පරිදි සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 46 වන වගන්තියේ කොන්දේසි වලට අනුකූලව ක්‍රියාත්මක කළයුතුය.

ඉහත පනතේ 46 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛන ප්‍රකාශයට පත්කර ඇත. තවද එකී පනතේ 46 වන වගන්ති ප්‍රකාරව 'හඳුනාගත් ඉදිකිරීම් වැඩක්' සඳහා උපදේශකයෙකු හෝ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකු ලෙස සුදුසුකම් ලත් තැනැත්තෙකු සම්බන්ධ කරගන්නා ඕනෑම පාර්ශවයක් ඒ සඳහා අධිකාරිය විසින් නිශ්චිතව දක්වා ඇති සම්මත ලේඛන භාවිතා කල යුතුය.

එබැවින් ශ්‍රී ලංකාව තුල සිදුකරන ඕනෑම හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සම්මත ලංසු ලේඛන පිළිපැදීමේ අවශ්‍යතාවය අවධාරණය කරමු.

සම්මත ලංසු ලේඛන පවසන පරිදි 'මෙම සම්මත ලේඛනයේ පළමු වෙළුමේ සංශෝධන කිරීම හෝ වෙනස් කිරීම් අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සිදුනොකළ යුතුය. එවැනි වෙනස්කම් 2 වන වෙළුමේ 2 කොටසේ-ලංසු දත්ත, 4(අ) කොටසේ-ගිවිසුම් දත්ත හා 4(බි) කොටසේ-විශේෂ ප්‍රතිපාදන යටතේ පමණක් ඉටු කල හැක.

ඒ අනුව සම්මත ලේඛන පිළිපැදීම හෝ එහි නියම කර ඇති කොන්දේසි වෙනස් කිරීම 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත පැහැර හැරීම පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් වන අතර එකී පනතේ විධිවිධාන යටතේ වැරදිකරුවකු වේ. එවැනි අවස්ථාවක 2014 අංක 33 දරණ ඉදකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 56 වන වගන්තිය ප්‍රකාරව නීතිමය පියවර ගැනීමට හැකියාව ඇත.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 67 වන වගන්තියට අනුව හඳුනාගත් ඉදිකිරීම් වැඩ පහත දක්වා ඇති පරිදි අර්ථ නිරූපනය කෙරේ.

1. රුපියල් මිලියන දහය (රු. 10,000,000.00) හෝ අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කල හැකි ඊට වඩා වැඩි යම් වැඩි වටිනාකමකින් යුක්ත වන්නා වූ සියලු ගොඩනැගිලි නිර්මිතයන් හෝ මහජනයාගේ පාවිච්චිය සඳහා වන යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ බිම් සැකසුමක්; සහ

2. පාරිසරික, භූ විද්‍යාත්මක හා සංස්කෘතික උරුම නියාමන ආයතනවල අනුමැතිය අවශ්‍ය වන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිත හෝ බිම් සැකසීම්

අ.පි.බ.



"සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07. "சவ்சிரிபாய", 123, விஜேராம மாவத்தை, கொழும்பு 07. "Savsiripaya", 123, Wijerama Mawatha, Colombo 07.
දුරකථන தொலைபேசி Telephone : +94 11 2686092, 2677043, 2699801, 2695965 ෆැක්ස් பெக்ஸ் Fax : +94 11 2699738 E-mail : info@cida.gov.lk Website : www.cida.gov.lk

Established as the Construction Industry Development Authority in Sri Lanka under the Construction Industry Development Act. No. 33 of 2014
Successor to Institute for Construction Training and Development (ICTAD)

යම් පෞද්ගලික අයිතිකරුවකුගේ පුද්ගල පාවිච්චිය සඳහා ඉදිකරන ලද යම් පෞද්ගලික නේවාසික ගොඩනැගිල්ලක් " හඳුනාගත් ඉදිකිරීම් වැඩ " යන යෙදුමේ අර්ථ නිරූපනයෙන් ඉවත් කරනු ලැබිය යුතුය.

*අ. කලේ*
**ඩබ් එස් සත්‍යානන්ද**
**ලේකම්**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
වැඩ බලන සභාපති
ඉදකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය